ඇමෙරිකා එක්සත් ජනපද තානාපති කාර්යාලය
කොළඹ

ප්‍රවෘත්ති නිවේදනය

මහජන කටයුතු අංශය
දුරකථනය: +94 (1) 249-8100 ෆැක්ස්: +94 (1)244-9070
ඉ-තැපෑල: TealCL@state.gov http: //srilanka.usembassy.gov

Release no:20121011

එක්සත් ජනපද තානාපති කාර්යාලය ගැහැනු දරුවාගේ දිනය සමරයි

ඔක්තෝබර් 11,2012: ගැහැනු දරුවාගේ ජාත්‍යන්තර දිනය ලෙස ඔක්තෝබර් 11 නම් කිරීමට 2011 වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් යෝජනාවක් සම්මත කරගන්නා ලදී. 2012 ජාත්‍යන්තර ගැහැනු දරුවාගේ දිනය සැමරීම සඳහා ශ්‍රී ලංකාවේ හා මාලදිවයිනේ එක්සත් ජනපද තානාපතිනිය වන මිෂෙල් සිසොන් මැතිනිය ගැලවීමේ හමුදා මූලස්ථාන නිවාසයේ "එමර්ජ් ලංකා" ආයතනයට විශේෂයෙන්ම පැමිණියාය. මෙහිදී ලිංගික හිංසනය පිළිබඳ උපදේශකයන් ලෙස ඔවුන් පුහුණු කරන වැඩමුළුවකට සහභාගිවන ගැහැනු දරුවන් හමුවීමට ඇයට අවස්ථාවක් ලැබුණි. ඇමරිකානු ශිෂ්‍යයෙකු විසින් ආරම්භ කරන ලද හා ශ්‍රී ලාංකික ඇමරිකන් ජාතිකයෙක් විසින් පවත්වාගෙන යන "එමර්ජ් ලංකා" ආයතනය, අපයෝජනයට ලක්වූ ගැහැනු දරුවන්ට නේවාසික පහසුකම් සපයමින් ඔවුන්ටත් ඔවුන්ගේ දරුවන්ටත් අවශ්‍ය පුද්ගලික, සමාජීය හා මූල්‍යමය ආධාර ද සපයයි. ගැහැනු දරුවන්ගේ සහභාගීත්වය ගැන ඔවුන්ට ස්තුති කළ තානාපතිනිය, වැඩිදුරටත් අදහස් දක්වමින්, " මෙම පුහුණුව තුළින් ඔබ බලවත්වනවා පමණක් නොව ඔබට ලැබිය යුතු අභිමානයෙන් පිරුණු නව ජීවිතයක් ගොඩනගා ගැනීමටද හැකිවනු ඇතැයි අප බලාපොරොත්තු වෙමු" යනුවෙන්ද ප්‍රකාශ කළාය.

ශ්‍රී ලංකාව පුරා ගැහැනු දරුවන්ට ආධාර කිරීම අරමුණු කරගත් වැඩසටහන් මාලාවක් කොළඹ එක්සත් ජනපද තානාපති කාර්යාලය විසින් වර්ෂය පුරාම ක්‍රියාත්මක කරයි. බස්නාහිර පළාතේ පිහිටි මුස්ලිම් ගැහැනු දරුවන්ගේ අනාථ නිවාසයක් වන "ෆාතිමා සුබසාධන මධ්‍යස්ථානය" වැනි නිවාස වල ඉංග්‍රීසි භාෂා පුහුණුව හා කියවීමේ සමාජ ආදියට තානාපති කාර්යාලය සහය දක්වයි. තානාපති කාර්යාලයේ සංවර්ධන අංශය වන ජාත්‍යන්තර සංවර්ධනය සඳහාවූ එක්සත් ජනපද ආයතනය (USAID) උතුරු හා නැගෙණහිර දැරියන්ට ප්‍රයෝජනවත් වන පාසල් හා ක්‍රීඩා භූමි ඉදි කිරීමටත් වෙනත් අධ්‍යාපනික සහය සැපයීමටත් ලබාදුන් ආධාර 34ක් යටතේ ඩොලර් මිලියන 2.5ක් වැය කර තිබේ. මඩකලපුව දිස්ත්‍රික්කයේ 12 හැවිරිදි රාජිත වැනි මෑතදී අකුරු ලිවීමට ඉගෙන ගත් දරුවන්ට, වයස 6-12 ත් අතර සිසුන්ට පිහිට වන මෙම වැඩ පිළිවෙල නිසා, ආපසු පාසලට ගෙස් සම වයසේ සගයන් මෙන් ඉගෙන ගැනීමට හැකි වී තිබේ.

දකුණු, බස්නාහිර හා නැගෙණහිර පළාත්වල දැරියන්ට ආරක්ෂාව සපයමින් ඔවුන්ගේ අයිතීන් පිළිබඳව දැනුවත් කරන " සේව් ද චිල්ඩ්‍රන්" ආයතනය තුළින් ක්‍රියාත්මක කරන 18 මාසයක වැඩ සටහනද ඇතුළුව ලිංගික හිංසාව අඩු කිරීමේ වැඩසටහන් වලටද එක්සත් ජනපද රජය ආධාර කරයි. ශ්‍රී ලාංකික රාජ්‍ය නොවන සංවිධානයක් වන" වුමන් ඉන් නීඩ්" (WIN) ආයතනය මගින් ක්‍රියාත්මක කරන යාපනයේ හා පුත්තලමේ ලිංගික හිංසනයට ගොදුරු වූවන්ට ආධාර කිරීමේ කටයුතු වලටද අරමුදල් සපයනු ලැබේ. මෙයට අමතරව ඩොලර් 740,000 ක ලිංගික හිංසන වෝහාරික පරීක්ෂණ

(SAFE) වැඩපිළිවෙළේ අරමුණ වන්නේ වැරදිකරුවන්ට සාර්ථක ලෙස නඩු පැවරීම තුළින් ලිංගික අඩන්තේට්ටම් සිදුවීම අවම කිරීමයි.

ලොව පුරා ගැහැනු දරුවන් ලිංගිකත්වය හා වයස නිසා අසාධාරණ ලෙස සැළකීමට භාජනය වේ. ගැහැනු දරුවන්ගේ අවශ්‍යතා පිළිබඳව සිවිල් සමාජය, රජය හා පුද්ගලික අංශය දැනුවත් කිරීමෙන් ගැහැනු දරුවන්ගේ අයිතිවාසිකම්වලට ප්‍රමුඛත්වය ලබා දෙමින් අනාගත පරම්පරා සඳහා ශක්තිමත් කාන්තාවන් බිහිකිරීමට හැකිවේය යන්න එක්සත් ජනපදයේ අපේක්ෂාවයි. ඔබ ඉදිරි වැඩකටයුතුවලට සම්බන්ධවීමට කැමතිනම් ටුවිට් මගින් කොළඹ ඇමරිකානු තානාපති කාර්යාලය අමතා (@USEmbSL #dayofthe girl) ගැහැනු දරුවන්ගේ දිනයෙන් ඔබට අදහස් වන්නේ කුමක්දැයි දන්වන්න.

තානාපතිනි සිසොන් මැතිනිය, ගැහැනු ළමයින් සවිබලගැන්වීමට ආධාරකරන ක්‍රියාකාරීන් සමග